මැතිවරණ කොමිෂන් සභාව

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119(4) යටතේ ගරු අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

தேர்தல் ஆணைக்குழு

பாராளுமன்றத்தின் அரச கணக்குக் குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119(4) இன் கீழ் கௌரவ அமைச்சரின் அவதானிப்புக்களும் மற்றும் அது தொடர்பாக எடுக்கப்படும் நடவடிக்கைகளும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்.

Election Commission

Submission of observations of Hon. Minister and steps taken with regard to the reports tabled by the Committee on Public Accounts in terms of Standing Order No. 119(4)

ආකෘතිය අංක 01

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය :- 79

ආයතනයේ නම :- **මැතිවරණ කොමිෂන් සභාව**

කමිටුව විසින් හඳුනාගන්නා ලද අඩුපාඩු		ආයතනය විසින් අඩුපාඩු නිවැරදි කර ගැනීමට ගන්නා ලද ක්‍රියාමාර්ග/ වත්මන් තත්ත්වය
01.	අභ්‍යන්තර විගණන විමසුම් සඳහා මසක් තුළ පිළිතුරු නොසැපයූ අවස්ථා	මසක් ඇතුළත පිළිතුරු ලබා ගැනීමට කටයුතු කර ඇත.
02.	සමාලෝචිත වර්ෂය තුළ විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් නියමිත පරිදි පවත්වා නොතිබීම.	2023 වර්ෂයේදී නියමිත පරිදි විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා ඇත.
03.	2017.06.26 දිනැති අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 7 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද වත්කම් හා අපහරණයන් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර නොතිබීම.	වත්කම් ලේඛනය යථාවත් නොකිරීම හේතුවෙන් අපහරණයන් පිළිබඳ හා මිලදී ගන්නා ලද වත්කම් පිළිබඳව කොම්ප්ට්‍රෝලර් ජනරාල් වෙත දන්වා නැත. මේ වන විට ලේඛනය යථාවත් කර ඇත. 2024 වර්ෂයේ තොරතුරු ඉදිරිපත් කළ හැක.
04.	සියලු වාහනවල රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොතිබීම.	මෙම කොමිෂන් සභාව ස්වාධීන ආයතනයක් බැවින් රහස්‍යභාවය ආරක්ෂා කර ගැනීමේ අවශ්‍යතාව මත රාජ්‍ය ලාංඡනය පින්තාරු කර නොමැත. නමුත් මැතිවරණ කොමිෂන් සභාව නමින් වූ නාම පුවරුවක් සෑම වාහනයකම ඉදිරිපසින් ප්‍රදර්ශනය කරනු ලබයි.
05.	මු.රෙ.94(1) ප්‍රකාරව වැය විෂයයකට සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂය අවසානයට ඉතිරි වූ ප්‍රතිපාදන සීමාව ඉක්මවන පරිදි බැරකම්වලට එළඹ තිබීම.	මු.රෙ.94(2) හා 94(3) ට අනුකූලව කාර්යාලීය කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා ඉහත බැරකම්වලට එළඹී ඇත. ඉදිරියේදී මු.රෙ.94(1) ට අනුකූලව බැරකම්වලට බැඳීමට කටයුතු කරමි.
06	සැලසුම්ගත පුහුණු අවස්ථාවලින් ලබා දී තිබූ පුහුණු අවස්ථා ප්‍රමාණය 50%ට වඩා අඩු මට්ටමක පැවතීම.	2022 වර්ෂය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදනවලින් 50% ප්‍රමාණයක් කපා හැරීම නිසා සැලසුම් සහගත පුහුණු අවස්ථා ප්‍රමාණය වෙත ළඟාවීමට නොහැකි විය. ලබා දී ඇති ප්‍රතිපාදනවලින් 92.8% ක් වියදම් කර ඇත.
07.	ආයතනයේ ගිණුම් පිළිබඳ විගණන මතය, යටත්ව මට්ටමේ/ ව්‍යාවන මට්ටමේ/ අහිතකර මට්ටමේ පැවතීම.	ස්ථාවර වත්කම්හි ආරම්භක ශේෂයන්හි පැවති වෙනස්කම් හා නිසි පරිදි ගිණුම්ගත නොවූ ඇතැම් ස්ථාවර වත්කම් හේතුවෙන් අහිතකර හෝ ව්‍යාවන මට්ටමේ විගණන මතයක් පැවතුනත් දැනට එම අඩුපාඩු නිවැරදි කර හොඳ මට්ටමක විගණන මතයක් ලබා ගැනීමට කටයුතු කර ඇත.

08.	2020.08.28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 12.1 ඡේදය ප්‍රකාරව ආයතනය විසින් ඉටුකළ යුතු කාර්යභාරය පැහැදිලි වන පරිදි එහි ප්‍රගතිය මිණුම් කළ හැකි කාර්යසාධක දර්ශක 03ක් හඳුනාගෙන නොතිබීම.	ඡන්දභිමි නාමලේඛනය සකස් කිරීම, ඡන්ද විමසීම් පැවැත්වීම, දේශපාලන පක්ෂ ලියාපදිංචි කිරීමට අදාලව ප්‍රගතිය මිනුම් කළ හැකි කාර්යය සාධක දර්ශක 04 ක් හඳුනාගෙන ඇත. i. ඡන්දභිමි නාමලේඛනය සහ ඡන්ද සංඛ්‍යාව ii. පවත්වන ලද ඡන්ද විමසීම් සංඛ්‍යාව iii. ලියාපදිංචි දේශපාලන පක්ෂ සංඛ්‍යාව iv. සංශෝධිත පනත් සංඛ්‍යාව
09.	සමස්ථ කාර්ය මණ්ඩලයට ඇතුළත්ව කාර්ය සාධන ගිවිසුම් සකස් කර ගිවිසුම්ගතව නොතිබීම.	මේ සම්බන්ධයෙන් දැනට කටයුතු කරමින් පවතී.
10.	විගණකාධිපති වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබීම.	විගණකාධිපතිවරයා විසින් පෙන්වා දෙනු ලබන අඩුපාඩු/ දෝෂ නිවැරදි කිරීමට අවශ්‍ය උපදෙස් හා ක්‍රියාමාර්ග සියලුම නිලධාරීන් වෙත ලබාදී ඇත.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි

නම:- **සමන් ශ්‍රී රත්නායක**
තනතුරු:- **මැතිවරණ කොමසාරිස් ජනරාල්**
දිනය:- 2024.10.30